# මිල, වැටුප් සහ සේවා නියුක්තිය

## සමස්ත මිල වෙනස්වීම්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයට (කො. පා. මි. ද.) අනුව සාමාන්‍ය මිල මට්ටමේ ඉහළ යාමේ වේගය 1993 දි සියයට 11.7 ක් සමඟ සසඳන විට 1994 දි එය සියයට 8.4 ක් පමණක් විය. මෙලෙස වාර්ෂික මිල වැඩිවීමේ සාමාන්‍ය වේගය 1987 න් පසු ප්‍රථම වතාවට 1994 දි තනි සංඛ්‍යාවකට පහත වැටුනි. ලක්ෂමය පදනම මත දර්ශකයේ වැඩිවීම දෙසැම්බර් මාසයේදී (1993 දෙසැ. මාසයට වඩා 1994 දෙසැ. මාසයට) සියයට 4.2 ක අඩු මට්ටමක පැවතුනි. ඒ හා සමඟ සසඳන විට 1993 දෙසැම්බර් මාසයේ පැවැති අනුරූපී ඉහළ යෑම සියයට 10.3 ක් විය. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයට වඩා පුළුල් භූගෝලීය ප්‍රදේශයක් ආවරණය කරන මහ කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙන්ද (ම. කො. පා. මි. ද.) 1994 දී වාර්තා වූයේ අඩු මට්ටමේ වාර්ෂික සාමාන්‍ය ඉහළ යාමක් වූ සියයට 4.8 කි. මෙය 1993 දි මහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය වාර්තා කල සියයට 8.4 ක ඉහළ යාමේ සිට වූ සැලකිය යුතු අඩුවීමකි. තොග වෙළෙඳ මිල දර්ශකයේද 1993 පැවැති සියයට 7.6 හා සසඳන විට 1994 දි සියයට 5.0 ක අඩුමට්ටමකට ඉහළ යෑමක් වාර්තා විය.

කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ ආහාර, රෙදිපිළි, ඉන්දන හා ආලෝකය සහ විවිධ යන උප කාණ්ඩ 1993 ට වඩා මන්දගාමී වේගයකින් 1994 දී වැඩි වී ඇත.ආහාර උපකාණ්ඩයේ පරිපාලන මිළ ගණන් අඩු කිරීම මිළ ඉහළයාමේ වේගය තනි ඉලක්කමක මට්ටමකට අඩු කිරීමට ප්‍රධාන වශයෙන් දයක විය. වසරේ පසුභාගය තුල පාන්, තිරිඟුපිටි හා භූමිතෙල් මිළ අඩුකරනු ලැබූ අතර සමහර සෘජු පාරිභෝගික භාණ්ඩ සඳහා වූ ආනයන බදු අඩු කිරීම හෝ ඉවත් කිරීම කරනු ලැබිය. සහල් මිල ගණන් වැඩිවීමේ මධ්‍යස්ථබව හා මිරිස් හා පොල් මිළගණන් අඩුවිම මෙන්ම රෙදිපිළි සහ විවිධ කාණ්ඩවල මිළ ගණන් වල මන්දගාමී වැඩිවීම ද වර්ෂය තුල උද්ධමන වේගයක් සීමා කිරීමට උපකාරී විය. කෙසේ වුවද මුදල් සැපයුම සියයට 19.6 කින් ඉහළ යාම තුලින් සාමාන්‍ය මිළ මට්ටම මත ඉහළ ඉල්ලුම් පීඩනයක් ඇති කිරීම අඛණ්ඩව සිදු විය.

### මිළ

### පාරිභෝගික මිළ

වසරේ මුල් මාස හතර තුළදී මිළගණන්වල සීග්‍රයෙන් ඉහළ යාමේ නැඹුරුවක් දක්නට ලැබිනි. මහ කන්නයේ අස්වැන්නත් සමගම මාර්තු සිට අප්‍රේල් කාලය තුලදී දක්නට ලැබෙන මිළ ගණන් වල සාමාන්‍ය මධ්‍යස්ථ බව මැයි මාසය තෙක්ම දක්නට නොලැබිණ. මෙයට හේතු වූයේ පමා වී ලැබුණ මෝසම් වැසි නිසා 1993/1994 මහ කන්නයේ වගා කටයුතු ප්‍රමාද වීමයි. මැයි මස සිට ඉදිරියට ජුනි මස සිට බල පැවැත්වූ මිළගණන් වැඩිවීමේ වේගය පැහැදිලි ලෙස අඩුවීමේ ප්‍රවනතාවක් පෙන්නුම් කරනු ලැබීය. පාලන මිළ අඩුකිරීම් තුළින් මෙම නැම්යාව ශක්තිමත් විය. තිරිඟු පිටි, පාන් සහ භූමිතෙල් මිල අඩුකිරීම් මගින් කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකයට සැලකිය යුතු බලපෑමක් ඇති කෙරිණි. මෙම මිළ අඩු කිරීම් සිදු නොවූයේ නම් මිළ ඉහළ යාමේ වේගය සැබැවින්ම වාර්තා වූ සියයට 8.4 වෙනුවට සියයට 10.1 ක් වීමට ඉඩ තිබුනි.

1.40 සංඛ්‍යා සටහන

**කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකය (1952 = 100)**

| ශීර්ෂය | වාර්ෂික සාමාන්‍යය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | සමකාලීන ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 1993 | 1994 | 1992 ට වඩා 1993 | 1993 ට වඩා 1994 | 1992 දෙසැ. වලට වඩා 1993 දෙසැ. වෙනසෙහි ප්‍රතිශතය | 1993 දෙසැ. වලට වඩා 1994 දෙසැ. වෙනසෙහි ප්‍රතිශතය |
| සියලුම ශීර්ෂ | 1,408.4 | 1,527.4 | 11.7 | 8.4 | 10.3 | 4.2 |
| භාණ්ඩ අනුව : | | | | | | |
| ආහාර | 1,519.4 | 1,654.1 | 11.2 | 8.9 | 10.0 | 3.6 |
| රෙදිපිළි | 782.7 | 795.7 | 8.2 | 1.7 | 8.0 | 0.2 |
| ඉන්දන හා ආලෝකය | 2,730.0 | 3,131.6 | 17.0 | 14.7 | 27.3 | 1.0 |
| ගෙවල්කුලී | 109.8 | 109.8 | - | - | - | - |
| විවිධ | 1,490.4 | 1,578.7 | 13.0 | 5.9 | 5.1 | 9.7 |

මූලයන් : ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව

මිළ දර්ශකයේ විශාලතම බරතැබූම ඇති (සියයට 61.9) ආහාර ද්‍රව්‍ය අයිතමය දර්ශකයේ සමස්ත ඉහළයාමෙන් සියයට 73 කට දයක විය. ඉන්දන හා ආලෝකය, විවිධ හා රෙදිපිළි කාණ්ඩවල සමස්ත මිල ඉහළ යාමට වූ දයකත්වය පිළිවෙලින් සියයට 14 ,12 සහ සියයට 1 ක් විය.

1994 දී වාර්ෂික සාමාන්‍ය පදනම මත ආහාර කාණ්ඩයේ මිළ ගණන් ඉහළ යාම සියයට 8.9 ක් වූ අතර ඒ හා සමහ සසඳන විට 1993 දී වූ වැඩිවීම සියයට 11.2 ක් විය. 1994 මැයි මාසයේදී කරවල හා වියළි ධාන්‍ය සඳහා වූ ආනයන බදු ඉවත් කරනු ලැබූ අතර ටින් මාළු හා සීනි සම්බන්ධයෙන් වූ බදු අඩු කරනු ලැබිය. 1994 ජූලි මාසයේදි තිරිඟු පිටි කිලෝග්‍රෑමයක මිළ රු.13.30 සිට 11.80 දක්වා අඩු කරනු ලැබිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රෑම් 450 ක පාන් ගෙඩියක මිළ රු. 5.50 සිට රු. 5.00 දක්වා පහත වැටිනි. නව රජය බලයට පත්වූ පසු තිරිඟු පිටි මිළ තවදුරටත් කිලෝ ග්‍රෑමකට රු. 7.45 දක්වා අඩු කරනු ලැබූ අතර ග්‍රෑම් 450 ක පාන් ගෙඩියක් රුපි. 3.50 දක්වා පහත වැටුණි. වාසිදයක සැපයුම් තත්ත්වය වසර තුලදී ප්‍රධාන ආහාර ද්‍රව්‍ය කිපයක මිළගණන් ඉහළ යෑම සීමා කිරීමට උපකාර විය 1994 වර්ෂයේ දී පෙර වර්ෂය සමහ සසඳන විට වී නිෂ්පාදනය ඉහළ ගොස් ඇති බව ඇස්තමේන්තු කර ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පෙර වර්ෂයේ සාමාන්‍ය මිළ මට්ටම සමහ සසඳන විට සහල් මිළගණන් වෙනසක් නොවූ තරම් විය. තිරිඟුපිටි හා පාන් මිළ ගණන් අඩුවීමෙන් වූ ආදේශන බලපෑමත් සහල් මිළගණන් ස්ථායීවීමට හේතු වූවා විය හැක. නිෂ්පාදනයේ ප්‍රගතිය හේතුකොට පොල් මිල අඩු වූ අතර වෙළෙඳපොලේ ආනයනික වියළි මිරිස් ලබා ගැනීමට හැකිවීම හේතුකොට එහි මිල අඩු විය. එළවළු, රතුළුණු, මාළු හා අර්තාපල් යන ද්‍රව්‍යවල සීඝ්‍ර මිළ වැඩිවීම් වාර්තා විය. කෙසේ වුවද පාන්, පොල් හා වියලි මිරිස් මිළ ගණන් අඩුවීම් ආහාර ද්‍රව්‍යවල සමස්ත මිළ ගණන් ඉහළයාම අඩුකිරීමට ප්‍රධාන වශයෙන් දයක විය.

ඉන්ධන හා ආලෝකය කාණ්ඩයේ මිළගණන් 1994 දී සියයට 14.7 කින් වැඩිවූ අතර ඒ හා සමහ සසඳන විට 1993 දී එය 17.0 කින් වැඩි විය. මෙම කාණ්ඩය තුළ භූමිතෙල් ලීටරයක මිල රු. 11.80 සිට රු. 9.50 දක්වා පසුගිය සැප්තැම්බර් මාසයේදි අඩු කිරීම හේතුවෙන් වසරේ අවසාන කාර්තුවේ මිලගණන් කෙරේ සහනදයී බලපෑමක් ඇති විය. දර මිළ පසුගිය වසරේ මැද සිට අඛණ්ඩව වර්ධනය වීම මිළගණන් ඉහළට තල්ලුවීමට හේතු විය.

රෙදිපිලි කාණ්ඩයේ මිළගණන් පසුගිය වසරේ ඉහළයාම වූ සියයට 8.2 හා සසඳන විට මෙම වසර තුල සියයට 1.7 ක සුළු වැඩිවීමක් පෙන්නුම් කරයි. විවිධ කාණ්ඩයේ මිළගණන් සියයට 5.9 කින් වැඩිවූ අතර එය පසුගිය වසරේ ඉහළ යාම වූ සියයට 13.0 සමඟ සසඳනවිට සැලකිය යුතු පහත බැසීමකි.

## මහකොළඹ පාරිභෝගික මිළ දර්ශකය

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන මහ කොළඹ පාරිභෝගික මිළ දර්ශකය (ම. කො. පා. මි. ද.) කො. පා. මි. ද. ට වඩා පුළුල් වූ භාණ්ඩ ප්‍රමාණයක් සහ භූගෝලීය ප්‍රදේශයක් ආවරණය කෙරෙන දර්ශකයකි. තවද මෙමදර්ශකයේ බරතැබීම් කො. පා. මි දර්ශකයේ බර තැබීම් වලට වඩා යාවත් කාලීන වන අතර එම බර තැබීම් පදනම් වී ඇත්තේ 1985/86 දී පැවැත්වූ සමීක්ෂණයකට අනුව මහ කොළඹ ප්‍රදේශයේ පහලම සියයට 40 ට අයත් වූ ගෘහ ඒකකයින්ගේ (වියදම අනුව පෙල ගැස්වූ) වියදම් රටාව මතය.

1994 වර්ෂයේදී මහ කොළඹ පාරිභෝගික මිළ දර්ශකය කොළඹ පාරිභෝගික මිළ දර්ශකයට වඩා බොහෝ අඩු වූ ඉහළයෑමක් පෙන්නුම් කරයි. මෙම දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වැඩිවීම 1994 වර්ෂයේදී සියයට 4.8ක් වූ අතර 1993 දි වැඩිවීම සියයට 8.4 කි. ලක්ෂ්‍යමය පදනම මත සලකා බැලීමේදී (1993 දෙසැ. මාසයට වඩා 1994 දෙසැ. මාසය) දර්ශකය සියයට 1.4 කින් පමණක් ඉහළ ගොස් තිබුණි. ම. කො. පා. මි. දර්ශකයට අනුව ආහාර මිළ ගණන් වසර තුල සියයට 4.0 කින් වැඩි වී ඇති අතර ඒ හා සසඳන විට කලින් වර්ෂයේ වැඩිවීම සියයට 8.7කි. ම. කො. පා. මි. දර්ශකයේ ඉන්දන හා ආලෝකය කාණ්ඩයේ මිළ ගණන් සියයට 17.0 කින් වැඩි වි ඇති අතර එය කලින් වර්ෂයේ ඉහළ යාමේ ප්‍රතිශතයට සමාන වූ වැඩිවීමකි. රෙදිපිලි හා පාවහන් කාණ්ඩයේ මිළගණන් වල ඉහළයෑම සියයට 3.9 ක් වූ අතර එය පෙර වර්ෂයේ වැඩිවීම වූ සියයට 8.2 සමඟ සසඳන විට සැලකිය යුතු පහත බැසීමකි. මත්පැන්, දුම්කොළ, බුලත් සහ පුවක්, සනිපාරක්ෂක, ගෘහස්ත භාණ්ඩ හා සේවා සහ ගමනාගමන හා විදුලි සන්දේශ යන කාණ්ඩයන්ගේ මිළගණන්වල ඉහළයෑම පිළිවෙලින් සියයට 8.2 , සියයට 6.7 හා සියයට 0.5 වශයෙන් වූ අතර එය එම කාණ්ඩවල කලින් වර්ෂයේ පෙන්නුම්කල ඉහළ යෑමට වඩා අඩු වී ඇත.

1.41 සංඛ්‍යා සටහන

**මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකය**

**1989 ජනවාරි සිට ජූනි = 100**


| ශීර්ෂය | වාර්ෂික සාමාන්‍යය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | සමකාලීන ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 1993 | 1994 | 1992 ට වඩා 1993 | 1993 ට වඩා 1994 | 1992 දෙසැ. වලට වඩා 1993 දෙසැ. වෙනසෙහි ප්‍රතිශතය | 1993 දෙසැ. වලට වඩා 1994 දෙසැ. වෙනසෙහි ප්‍රතිශතය |
| සියලුම ශීර්ෂ | 164.8 | 172.6 | 8.4 | 4.8 | 6.9 | 1.4 |
| භාණ්ඩ අනුව : | | | | | | |
| ආහාර පාන | 172.2 | 179.1 | 8.7 | 4.0 | 6.6 | - |
| මධ්‍යපාන, දුම්කොළ, බුලත් සහ පුවක් | 180.1 | 194.9 | 13.3 | 8.2 | 5.6 | 9.9 |
| ගෙවල් කුලී | 109.3 | 109.5 | 0.1 | 0.2 | 0.2 | 0.2 |
| ඉන්දන සහ එළිය | 157.9 | 184.8 | 17.0 | 17.0 | 25.7 | 6.2 |
| රෙදිපිළි සහ පාවහන් | 190.3 | 197.8 | 8.2 | 3.9 | 5.8 | 5.6 |
| සනීපාරක්ෂක, සෞඛ්‍ය සේවා, ගෘහස්ත භාණ්ඩ හා සේවා | 154.9 | 165.3 | 8.3 | 6.7 | 7.5 | 6.0 |
| ගමනා ගමන සහ විදුලි සංදේශ | 163.5 | 164.3 | 1.1 | 0.5 | 1.2 | - |
| විවිධ | 134.3 | 149.3 | 2.9 | 11.6 | 4.6 | 16.0 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව.

# තොග අලෙවි මිල දර්ශකය

1974 = 100

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

දර්ශක දෙකේ බරතැබීම්වල වෙනස්කම්, වර්ෂය තුලදී ඒවායේ මිළගණන් වැඩිවීම් අනුපාතිකයන්ගේ වෙනස්වීමට හේතු වී ඇත. විශේෂයෙන්ම. මිළ වැඩිවීම් පෙන්නුම් කල එලවළු සහ මාළු වැනි අයිතමයන් සඳහා කොළඹ පාරිභෝගික මිළ දර්ශකයට වඩා මහ කොළඹ පාරිභෝගික මිළ දර්ශකයේ අඩු බරතැබීමක් ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් මහ කොළඹ පාරිභෝගික මිළ දර්ශකය කොළඹ පාරිභෝගික මිළ දර්ශකයට වඩා අඩු වේගයකින් ඉහළ ගියේය.

## තොග වෙළඳ මිළ දර්ශකය

තොග වෙළෙඳ මිළ දර්ශකය (තො. වෙ. මි. ද.) මගින් ප්‍රාථමික වෙළඳපොල මට්ටමේ මිළ වෙනස්වීම් ගණනය කරනු ලබයි. 1994 දී තොග වෙළඳ මිළ දර්ශකය 1993 මට්ටමට වඩා සියයට 5.0 කින් වැඩි වී ඇත. මෙය 1993 වර්ෂයේ දී වූ වැඩිවීම වන සියයට 7.6 ට වඩා අඩු මට්ටමකි. තේ හා පොල් වැනි ප්‍රධාන අපනයන භාණ්ඩවල මිළගණන් පහතයාම වර්ෂය තුල පැවති මිළගණන්වල ක්‍රමික අඩුවීමට ප්‍රධාන වශයෙන් දායක විය. ආහාර උප කාණ්ඩයේ මිළගණන් වර්ෂය තුල සුළු වශයෙන් අඩු වූ අතර මධ්‍යපාන, පසුගිය වසරේ වාර්තා වූ ඉහළයාම් සමඟ සසඳන විට රෙදිපිළි හා පාවහන්, රසායනික හා රසායනික නිෂ්පාදන සහ ඛණිජ තෙල් නිෂ්පාදන යන කාණ්ඩවල මිළගණන් වැඩිවීමේ වේගයේ අඩුවීමක් පෙන්වයි. කෙසේ නමුත් වසර තුල ලෝහ නොවන නිෂ්පාදන, ඉන්දන හා ආලෝකය සහ විවිධ යන කාණ්ඩවල සීඝ්‍ර මිළ ඉහළයෑම් වාර්තා විය.

1.42 සංඛ්‍යා සටහන

**තොග අලෙවි මිළ දර්ශකය (1974 = 100)**

| ශීර්ෂ | වාර්ෂික සාමාන්‍යය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | සමකාලීන ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 1993 | 1994 | 1992 ට වඩා 1993 | 1993 ට වඩා 1994 | 1992 දෙසැ. වලට වඩා 1993 දෙසැ. වෙනසෙහි ප්‍රතිශතය | 1993 දෙසැ. වලට වඩා 1994 දෙසැ. වෙනසෙහි ප්‍රතිශතය |
| සියලුම ශීර්ෂ | 831.8 | 873.4 | 7.6 | 5.0 | 7.7 | 1.8 |
| භාණ්ඩ අනුව : | | | | | | |
| ආහාර | 770.4 | 760.4 | 7.0 | -1.3 | 4.2 | -4.3 |
| මධ්‍යපාන | 956.2 | 969.2 | 7.9 | 1.4 | 1.7 | - |
| රෙදිපිළි හා පාවහන් | 452.1 | 482.9 | 8.0 | 6.8 | 10.4 | 4.0 |
| කඩදාසි නිෂ්පාදන | 745.2 | 761.6 | 5.7 | 2.2 | 7.9 | -0.1 |
| රසායන හා රසායනික නිෂ්පාදන | 542.2 | 550.4 | 2.1 | 1.5 | -1.2 | 3.4 |
| ඛනිජතෙල් නිෂ්පාදන | 1,240.8 | 1,295.0 | 9.2 | 4.4 | 12.5 | -7.7 |
| ලෝහ නොවන නිෂ්පාදන | 1,566.8 | 1,896.1 | 15.5 | 21.0 | 20.1 | 14.3 |
| ලෝහ නිෂ්පාදන | 659.1 | 698.2 | 12.0 | 5.9 | 16.5 | 0.1 |
| ප්‍රවාහන උපකරණ | 660.0 | 682.2 | 5.9 | 3.4 | 1.6 | 5.8 |
| විදුලි උපකරණ සහ සැපයීම | 635.4 | 691.8 | 5.3 | 8.9 | 9.4 | 10.2 |
| යන්ත්‍රෝපකරණ | 492.7 | 547.0 | 11.9 | 11.0 | 13.4 | 6.3 |
| ඉන්දන හා ආලෝකය | 1,307.5 | 1,739.3 | 1.3 | 33.0 | 8.8 | 44.2 |
| විවිධ | 1,480.0 | 2,050.5 | 11.8 | 38.5 | 28.9 | 31.3 |
| ආංශික වර්ගීකරණය I | | | | | | |
| දේශීය ගණය | 737.6 | 833.6 | 5.8 | 13.0 | 9.8 | 8.6 |
| ආනයන ගණය | 671.6 | 702.0 | 5.9 | 4.5 | 10.7 | -5.8 |
| අපනයන ගණය | 1,235.5 | 1,169.1 | 11.4 | -5.4 | 2.9 | -3.0 |
| ආංශික වර්ගීකරණය II | | | | | | |
| පාරිභෝගික භාණ්ඩ | 814.3 | 818.8 | 7.0 | 0.6 | 4.5 | -1.6 |
| අන්තර් භාණ්ඩ | 874.5 | 1,029.1 | 8.3 | 17.7 | 17.3 | 10.6 |
| ආයෝජන භාණ්ඩ | 938.3 | 1,094.8 | 13.7 | 16.7 | 16.7 | 11.5 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

ආහාර උප දර්ශකය වසර තුල සියයට 1.3 කින් සුළු වශයෙන් අඩු විය. මෙය තොග වෙළඳ මිළ දර්ශකයේ වඩා ප්‍රමුඛ උප දර්ශකය වේ. කෙසේ නමුත් ආහාර කාණ්ඩයේ මිල වෙනස්වීම් වලට තදින්ම බලපෑවේ දර්ශකයේ වැඩි බරතැබීමක් ඇති ආහාර කාණ්ඩය යටතට ගැනෙන තේ, පොල් හා පොල් නිෂ්පාදන වැනි ප්‍රධාන නිර්යාත භාණ්ඩවල මිලගණන් වල වෙනස්වීම්ය. වසර තුල උස්බිම්, මැදිබිම්, පහත්බිම් තේ වර්ග තුනේම මිළගණන්වල මිළ අඩු වි ඇති අතර පොල් මිළ සියයට 20 කින් තියුණු ලෙස පහත වැටුනු අතර පොල්තෙල් මිළ ආසන්න වශයෙන් සියයට 15කින් අඩුවිය. තවද මීට අමතරව විවෘත වෙළෙඳපොලේ වී මිළ ද සියයට 8 ක සැලකිය යුතු ප්‍රමාණයකින් පහත වැටුණු අතර තිරිඟු පිටි මිළ සියයට 11 කින් අඩුකරනු ලැබිය. වියලි මිරිස් මිළගණන් ද වසර තුල පහත වැටුණි. මෙම මිළ අඩුවීම් මගින් මාළු එළවළු අර්තාපල් සීනි වැනි භාණ්ඩයන්හි සීග්‍ර මිළ වැඩිවීම් සමනය කරනු ලැබූ අතර, එය වසරේ ආහාර උප දර්ශකයේ අඩුවීමට හේතු විය.

ලෝහ නොවන නිෂ්පාදන සඳහා වූ උප දර්ශකය සියයට 21.0 කින් 1994 දී වැඩි වූ අතර එය 1993 වාර්තා වූ මිළ ඉහළ යෑම වූ සියයට 15.5 ඉක්මවා යෑමක් විය. සිමෙන්ති සහ ගඩොල් වැනි ප්‍රධාන ඉදිකිරීම් ද්‍රව්‍යවල මිළගණන් ඉහළයාම මෙම වැඩිවීමට සැලකිය යුතු ලෙසින් දයක විය.

විවිධ අයිතම කාණ්ඩය තුල මිළගණන් සියයට 38.5 ක තරම් ඉහළ ප්‍රමාණයකින් වසර තුළ වැඩි වී ඇත. ඒ හා සමඟ සසඳන විට පෙර වර්ෂයේ වූ එම වැඩිවීම සියයට 11.8 කි. වෙන්දේසියේ රබර් මිළ (ආර් එස් එස් 1 ) ඉහළ යෑම සියයට 40 කට වඩා වැඩිවීම ප්‍රධාන වශයෙන් මෙම කාණ්ඩයේ මිළගණන් ඉහළයාමට හේතු විය.

දර මිළ සීග්‍රව වැඩිවීම ප්‍රධානවශයෙන් හේතුකොට ඉන්දන හා ආලෝක කාණ්ඩයේ මිලගණන් වල සියයට 33 ක සීග්‍ර මිළ ඉහළයාමක් වාර්තා විය. විදුලි උපකරණ හා සැපයීම් උප දර්ශකයේ මිළගණන් සියයට 8.9 ක තරම් සීග්‍ර වැඩිවීමක් වාර්තා කරනු ලැබිත. කලින් වර්ෂයේ මෙම උප දර්ශකයේ වාර්තා වූ වැඩිවීම සියයට 5.5 කි.

රසායනික හා රසායනික නිෂ්පාදන කාණ්ඩයේ මිළගණන් සියයට1.5 කින් වැඩි වූ අතර ඒ හා සසඳන විට කලින් වර්ෂයේ වාර්තා වූ ඉහළයෑම සියයට 2.1 ක් විය. මෙම කාණ්ඩය තුල පොහොර සහනාධාරය නැවත හඳුන්වාදීම සමඟ යූරියා වැනි රසායනික පොහොර මිළ අඩුකරනු ලැබිය. ඛණිජතෙල් නිෂ්පාදන කාණ්ඩයේ මිළගණන් සියයට4.4 කින් ඉහල ගිය අතර ඒ හා සසඳන විට කලින් වර්ෂයේදී වැඩිවීම සියයට 9.2කි. 1994 අවසාන කාර්තුවේදී භූමිතෙල් හා ඩිසල් මිල අඩුකිරීම මගින් මෙම උප දර්ශකයේ පබල බලපෑමක් ඇතිවුනි. මධ්‍යපාන, රෙදිපිළි හා පාවහන්, ප්‍රවාහන උපකරණ යන ශීර්ෂ වල මිළගණන් පිළිවෙලින් සියයට 1.4 , 6.8 , 2.2හා 3.4 වශයෙන් වැඩිවුනි. 1993 දී මෙම ශීර්ෂ හතරේ ඉහළයෑම පිළිවෙලින් සියයට 7.9 , 8.0 , 5.7 හා 5.9 වශයෙන් වාර්තා වුණි.

දර්ශකයේ අවසාන උපයෝජනය අනුව කෙරෙන වර්ගීකරණයට අනුව දේශීය ගණයේ මිළගණන් සියයට 13.0 ක සීග්‍ර ලෙස ඉහළ නැගුණි. . ඒ හා සමඟ සසඳන විට කලින් වර්ෂයේ වාර්තා වූ වැඩිවීම සියයට 5.8 කි. ආනයනය කාණ්ඩයේ මිලගණන් සියයට 4.5 කින් වැඩි වූ අතර මීට මඳ වශයෙන් වූ ඉහළ වර්ධනයක් 1993 දී වාර්තා විය. කෙසේ නමුත් අපනයන කාණ්ඩයේ මිලගණන් සියයට 5.4 කින් පහත වැටුන අතර ඒ හා සමඟ සසඳන විට 1993 දි සියයට 11.4 ක සැලකිය යුතු ඉහළයෑමක් වාර්තා විය.

අවසාන උපයෝජන වර්ගීකරණයේ පාරිභෝගික භාණ්ඩ මිළගණන් සියයට 0.6 කින් සුළු වශයෙන් වැඩි විය. ඒ හා සමඟ සසඳන විට කලින් වර්ෂයේ වර්ධනය සියයට 7.0 ක් විය. අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ කාණ්ඩවල මිළගණන් පිළිවෙලින් සීග්‍ර ලෙස සියයට 17.7 හා 16.7 වශයෙන් වර්ධනය විය. පසුගිය වර්ෂයේදී මෙම කාණ්ඩවල මිළගණන් වල සුළු වර්ධනයක් වූ අතර එය පිළිවෙලින් සියයට 8.3 හා සියයට 13.7 ක් විය.

## වැටුප්

1994 වසරෙහි රජයේ සේවක වැටුප් වැඩිවීම පෙර වසරට වඩා සෙමෙන් සිදුවිය. 1993 දී නියම කරන ලද නව වැටුප් පරිමාණයන් ක්‍රියාත්මකවීමෙන්, එම වසර තුළ වැටුප් ඉහළයාම සියයට 21.1 ක් විය. සියයට 8.9 ක්වූ 1994 වසරෙහි වැටුප් ඉහළයාම, වසර තුළ පිළිබිඹු කළ මිළ ඉහළයාමේ අනුපාතය හා ගැලපීමට තරම් ප්‍රමාණවත් විය. සංවිධිත පෞද්ගලික අංශයේ සමස්ත වැටුප් වැඩිවීම පහත වැටුන අතර පෙර වසර හා සැසඳීමේදී මූර්ත වැටුප් පහත වැටුනි. නමුත් සේවා අංශයේ සේවකයන්ගේ වැටුප් සැලකිය යුතු ලෙස ඉහළ නැගුනි. තාවකාලික දත්ත අනුව,සංවිධානය නොවූ අංශවල සියලු අංශවල වැටුප් නාමිකව ඉහළ ගිය අතර, වී හා පොල් වගාවන්හි සහ ගොඩනැගලි ඉදිකිරීම් අංශයෙහි සැම කාර්යයන්හිම මූර්ත වැටුප්වල ඉහළයාමක් පෙන්නුම් කරයි.

### රාජ්‍ය අංශය

1993 වසරෙහි රාජ්‍ය අංශයෙහි වැටුප් සංශෝධනයෙහි අවසාන අදියර 1994 ජනවාරි මාසයේදී ක්‍රියාත්මක විය. මෙම අදියර යටතේ, 1992 දෙසැම්බර් වන විට, ආරම්භක වැටුප් රු. 3000/= හෝ ඊට වැඩි වූ රජයේ සේවකයන් සඳහා, 1993 නව වැටුප් වැඩිකිරීම අනුව නියමිත ඉතිරි සියයට 50 ලැබුනි. (මෙම වර්ෂය සඳහා වූ ආරම්භක සියයට 50 , 1993 ජනවාරි සිට ගෙවා තිබුනි.) වර්ෂය තුළ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල වැටුප් ව්‍යුහයෙහි විෂමතා ඉවත් කිරීම සඳහා 1994 අගෝස්තුවලදී වැටුප් සංශෝධනයන් සිදු විය. මධ්‍යම මට්ටමේ කාර්මික සේවයේ වැටුප් තලයන්හි සංශෝධනයක් ද සිදු කරන ලදි. වාර්ෂික ආරම්භක වැටුප රුපියල් 23,160/= හෝ ඊට අඩුවෙන් ලබන සියළුම වර්ගවල සුළු සේවකයන් සඳහා වැටුප් වර්ධක තුනක වැටුප් වැඩිකිරීමක් ප්‍රදානය කරන ලදී.

**1.43 සංඛ්‍යා සටහන**

**වැටුප් ප්‍රමාණ දර්ශක අංක**

**(1978 දෙසැම්බර් = 100)**


| ශීර්ෂ | 1993 | | 1994 | | 1993 ට වඩා 1994 වෙනසෙහි ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|
| | මූල්‍ය වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය | මූල්‍ය වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය | මූල්‍ය වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය |
| 1. රජයේ සේවකයන් | | | | | | |
| I. සියලුම විධායක නොවන නිලධාරීන් | 622.1 | 105.7 | 692.7 | 108.7 | 11.3 | 2.8 |
| II. සුළු සේවකයන් | 728.3 | 123.8 | 772.3 | 121.1 | 6.0 | -2.2 |
| III. සියළුම රජයේ සේවකයන් | 675.5 | 114.8 | 735.5 | 115.4 | 8.9 | 0.5 |
| IV. රජයේ පාසැල් ගුරුවරුන් | 567.1 | 96.3 | 595.6 | 93.4 | 5.0 | -3.0 |
| 2. පඩිපාලක සභා කර්මාන්තයන්හි කම්කරුවන් | | | | | | |
| I. කෘෂිකර්මයෙහි යෙදී සිටින කම්කරුවන් | 803.8 | 136.6 | 821.5 | 128.8 | 2.2 | -5.7 |
| II. කර්මාන්ත හා වාණිජ කටයුතු වල යෙදී සිටින කම්කරුවන් | 528.2 | 89.8 | 555.8 | 87.2 | 5.2 | -2.9 |
| III. සේවා අංශයෙහි කම්කරුවන් | 365.8 | 62.2 | 431.4 | 67.6 | 17.9 | 8.7 |
| IV. පඩි පාලක සභා කර්මාන්තයන්හි කම්කරුවන් | 685.7 | 116.6 | 712.4 | 111.7 | 3.9 | -4.2 |

මූලයන් : කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

# වැටුප් ප්‍රමාණ දර්ශක අංක

1978 දෙසැම්බර් = 100

ත්‍රෛමාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

රාජ්‍ය අංශයේ වැටුප් වෙනස්වීම මැනීම සිදු කරන්නේ රාජ්‍ය සේවකයන් සඳහා වූ මූල්‍ය වැටුප් දර්ශකය මගිනි. සියලුම රජයේ සේවකයින්ගේ මූර්ත වැටුප් දර්ශකය, 1994 වර්ෂය තුල සියයට 8.9 කින් වර්ධනය විය. සියයට 8.4 ක් වූ, 1994 වර්ෂයෙහි මිල ඉහළයාමේ අනුපාතය හා සැසඳීමේ දී, මූර්ත වැටුප් සියයට 0.5 ක ආන්තික ප්‍රගතියක් පෙන්නුම් කරයි. කෙසේ වුවද, 1993 නව වැටුප් පරිමාණයන් ක්‍රියාත්මකවීමෙන් මූල්‍ය වැටුප් ප්‍රමාණ දර්ශකය තියුණු ලෙස සියයට 21.1 කින් ද, මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය සියයට 8.3 කින් ද, 1993 දී වර්ධනය වී තිබුණි. විධායක නොවන නිලධාරීන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය සියයට 11.3 කින් වර්ධනය වූ අතර, ඔවුන්ගේ මූර්ත වැටුප් සියයට 2.8 කින් ඉහළ ගියේය. 1994 අගෝස්තු මාසයේදී, ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණිවලත්, මධ්‍යම මට්ටමේ කාර්මික සේවයේත් වැටුප් විෂමතා සංශෝධනය කිරීම, විධායක නොවන ශ්‍රේණිවල වැටුප් ඉහළයාමට හේතු විය. කෙසේ වුවද, පසුගිය වසරේ මූල්‍ය වැටුප් ප්‍රමාණ දර්ශකය සියයට 22.7 ක් තරම් වඩා ඉහළ වර්ධනයක් පෙන්වූ අතර, මෙම වර්ගයේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකයේ වර්ධනය සියයට 9.5 ක් විය. මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය සියයට 2.2 ක පිරිහීමක් පෙන්නුම් කරමින් 1994 දී සුළු සේවකයන් සඳහා වූ වැටුප් ප්‍රමාණ දර්ශකය සියයට 6.0 කින් වර්ධනය විය. වසර තුල රජයේ පාසල් ගුරුවරුන් සඳහා වැටුප් ප්‍රමාණ දර්ශකයේ සාමාන්‍යය සියයට 5.0 කින් ඉහළ ගොස් තිබුණු අතර එමගින් 1994 වසරේ මූර්ත වැටුප් වල සියයට 3.0 ක පිරිහීමක් පිළිබිඹු කරයි.

### සංවිධානය වූ පෞද්ගලික අංශය

1994 දී, පඩි පාලක සභාව මගින් ආවරණය වන සේවකයන් සඳහා වූ වැටුප් ප්‍රමාණ දර්ශකය සියයට 3.9 කින් වර්ධනය විය. මෙය 1993 වසරෙහි පිළිබිඹු කරන ලද සියයට 16.2 ක වර්ධනය හා සැසඳීමේදී සැහෙන අඩු වර්ධනයකි. පඩිපාලක සභාව මගින් ආවරණය වන සේවකයන් සඳහා වූ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය 1994 තුළ සියයට 4.2 කින් පිරිහුනි. පෙර වසරේදී මූර්ත වැටුප් සියයට 4.1 කින් වර්ධනය වී ඇත. දර්ශකයට වැඩි බලපෑමක් ඇති කරන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සේවක වැටුප්වල වර්ධනය සෙමින් සිදුවීම පඩිපාලක සභා මගින් ආවරණය වන සේවකයන් සඳහා වූ වැටුප් දර්ශකයේ සමස්ථ වැඩිවීම පහත් මට්ටමක පැවතීමට හේතු විය. කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි සේවකයන් මේ වසරෙහි ලබාගත් සියයට 2.2 ක් වූ මූල්‍ය වැටුප් වර්ධනයෙන් මූර්ත වැටුප්වල සියයට 5.7 ක පිරිහීමක් පෙන්නුම් කරයි. පෙර වසරෙහි කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සේවක වැටුප්, නාමිකව සියයට 21.1 ක සැලකිය යුතු වර්ධනයක් පෙන්වා තිබූ අතර, මූර්ත වැටුප් සියයට 8.3 කින් ඉහළ ගොස් තිබුණි. මෙම සේවකයන්ට අයවැය දීමනාවක් වශයෙන් ප්‍රදානය කරන ලද රු. 12/= ක දෛනික දීමනාව දීමත් සමඟ 1993. 01. 01 දින සිට ජීවන වියදම් දීමනාව නොවෙනස්ව පැවතීම නිසා රාජ්‍ය වැවිලි අංශයේ සේවක වැටුප් මට්ටමේ වෙනසක් ඇති නොවීය. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සේවකයින් සඳහා වූ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය මත සැලකියයුතු බර තැබීමක් රාජ්‍ය වැවිලි අංශයේ සේවක වැටුප් වලට තිබීම සහ ඔවුන්ගේ වැටුප් නොවෙනස්වපැවතීම මෙම අංශයේ වැටුප් වැඩිවීම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, වසර තුළ සේවා අංශයෙහි සේවක වැටුප් නාමිකව සියයට 17.9 කින් ඉතා තියුණු ලෙස වර්ධනය වූ අතර, ඔවුන්ගේ මූර්ත වැටුප් සියයට 8.7 කින් වර්ධනය විය. 1993 වසරෙහි දී මෙම කම්කරුවන්ගේ වැටුප්වල නාමික අගය නොවෙනස්ව පැවතුන අතර, මූර්ත වැටුප් සියයට 10.6 කින් පහත වැටුණි. සියයට 5.2 ක් වූ 1994 වසරෙහි කර්මාන්ත සහ වෙළඳ අංශවල සේවකයින්ගේ වැටුප් වර්ධනය පසුගිය වසරේ වාර්තාගත වර්ධනයට (සියයට 3.4) වඩා අඩු විය. කෙසේ වුවද 1994 වසරෙහි මූර්ත වැටුප සියයට 2.9 ක අඩුවීමක් පිළිබිඹු කරයි.

පෞද්ගලික ආරෝග්‍ය ශාලා, ඇඟලුම් නිෂ්පාදන සහ මෝටර් ප්‍රවාහන යන අංශවල සේවකයන්ගේ අවම වැටුප් 1994 දී සංශෝධනය කරන ලදී.

## අසංවිධිත අංශය

දිප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල යටතේ, උතුරු පළාත හැර දිවයින පුරා විසිරුන මධ්‍යස්ථාන 100 කින් පමණ දෛනික වැටුප් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සිදු වේ. මෙම වැටුප් වී වගාවේත් සුළු පරිමාණයෙන් කෙරෙන තේ, රබර් සහ පොල් යන වැවිලිවලත්, ගොඩනැගිලි ඉදිකිරීම් අංශයන්හිත් විවිධ කාර්යයන් සඳහා වේ.

1994 දී අසංවිධිත අංශයේ සියළු කාර්යයන්හි වැටුප් වර්ධනය විය. වී වගාවේ වැටුප් වැඩිවීමේ වේගය සියයට 8 ත් 17 ත් අතර පරාසයක පැවතුනු අතර සියළුම කාර්යයන්හි මූර්ත වැටුප් ඉහළ ගියේය. පොල් වගාවෙහි ද මූල්‍ය වැටුප් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර සියළුම කාර්යයන්හි මූර්ත වැටුප් ඉහළ ගියේය. මීට සාපේක්ෂව තේ සහ රබර් වගාවන්හි වැටුප් වර්ධනය සෙමින් සිදුවූ අතර කාර්යයන් කිපයකම මූර්ත වැටුප් අඩු විය. ගොඩනැගලි ඉදිකිරීම් කාර්යයන්හි සියළු වර්ගවලට අයත් කම්කරුවන්ගේ මූල්‍ය වැටුප් වැඩිවීම සියයට 10 ත් 11 ත් අතර පරාසයක විය. සියයට 8.4 ක් වූ මිළ ඉහළ යාමේ අනුපාතය හා සසඳන කළ මූර්ත වැටුප් ඉපැයීම්වල ඉහළයාමක් පෙන්නුම් කරයි.

## සේවා නියුක්තිය

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සමීක්ෂණයට අනුව රාජ්‍ය අංශයේ හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි මුළු සේවක සංඛ්‍යාව 1994 වර්ෂය අවසානයේදී දසලක්ෂ 1.32 ක් පමණ වන බවට ඇස්තමේන්තු කර ඇති අතර මෙය පසුගිය වසරට වඩා සියයට 2 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

1.44 සංඛ්‍යා සටහන

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය

| | අනු අංශය | 1992 | 1993 | 1994 |
|---|---|---|---|---|
| 1. | මධ්‍යම රජය පළාත් සභා හා පළාත් පාලන ආයතන | 653,959 | 676,483 | 699,898 |
| 2. | අර්ධ රාජ්‍ය ආයතන | 637,271 | 618,794 | 625,266 |
| | **එකතුව** | 1,291,230 | 1,295,277 | 1,325,164 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1994 වසරේදී මධ්‍යම රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල සේවා නියුක්තිය 699,898 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇති අතර මෙය 1993 වසරට වඩා සියයට 3.5 ක වැඩිවීමකි. මෙම වැඩිවීමට විශාල වශයෙන් බලපා ඇත්තේ වෛද්‍යවරු සහ සෞඛ්‍ය සේවාවේ අතිකුත් සේවක කාණ්ඩයන්හි සහ ලිපිකරු සහ ඊට සම්බන්ධ සේවා නියුක්ත කාණ්ඩයෙහි පසුගිය වසරට වඩා පිළිවෙලින් සියයට 8 ක සහ සියයට 6 ක වැඩිවීමක් පෙන්නුම් කිරීමයි. ආරක්ෂක කටයුතු වල නියුක්ත සේවකයින් අයත් සේවාවන්හි නියුක්ත සේවක කාණ්ඩය අදල කාලය තුල සියයට 4 කින් වැඩි වී ඇත. සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රජය විසින් අත්කරගෙන ඇති ව්‍යාපෘති හා රාජ්‍ය අංශයෙහි බැංකු වලින් සමන්විත අර්ධ රාජ්‍ය අනු අංශයෙහි සේවා නියුක්තිය පසුගිය වසරට වඩා සියයට 1 ක සුළු වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ ලිපිකාර හා ඊට සම්බන්ධ සේවා නියුක්ත කාණ්ඩයෙහි සහ වෘත්තීය, ශිල්පීය හා ඊට සම්බන්ධ සේවක කාණ්ඩයෙහි පිළිවෙලින් සියයට 5 ක සහ සියයට 4 ක වැඩිවීමයි.

සේවා නියුක්තිය රැකියා වර්ගීකරණයට අනුව රාජ්‍ය අංශයේ විශාලතම සේවක සංඛ්‍යාවක් ඇති රැකියා කාණ්ඩය බරවැඩ කම්කරුවන් ඇතුලත් වන රැකියා කාණ්ඩය වන අතර මුළු සේවක සංඛ්‍යාවෙන් එම කොටස සියයට 36 ක් විය. කෙසේ වුවද, මෙම රැකියා කාණ්ඩයෙහි සේවක සංඛ්‍යාවේ අඩුවීමේ ප්‍රවනතාවයක් පසුගිය වර්ෂ කිහිපය තුල දක්නට ලැබුනි. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත්තේ වතු අංශයේ කම්කරු කාණ්ඩයෙහි සේවකයින් අඩුවීමය.

සංවිධිත පෞද්ගලික අංශයෙහි සේවා නියුක්තිය පිළිබඳව වාර්ෂික දත්ත නොමැති බැවින් එම අංශයෙහි සේවා නියුක්තිය තක්සේරු කිරීමට අර්ථසාධක අරමුදල්හි ලියාපදිංචි සේවක සංඛ්‍යාව වැනි වෙනත් දර්ශක යොදා ගෙන ඇත. අනුමත අර්ථසාධක අරමුදල්හි සේවක ගිණුම් සංඛ්‍යාව සියයට 1 ක සුළු වැඩිවීමක් මෙම වර්ෂයේ පෙන්නුම් කර ඇත. සේවක අර්ථසාධක අරමුදලේ ගිණුම් සංඛ්‍යාව සියයට 6 ක වැඩිවීමක් 1993 වසරේදී පෙන්නුම් කරන ලදී. 1994 වර්ෂයේ ආර්ථික වර්ධනය දෙස බලන විට මෙම වැඩිවීමේ උපනතියම තවදුරටත් පැවතෙනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපාරික ආයතන වල සේවක සංඛ්‍යාව 1994 වර්ෂය අවසාන වනවිට 134,572 ක් වූ අතර මෙය 1993 වර්ෂය හා සසඳන විට සියයට 10 ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම සේවක සංඛ්‍යාවෙන් සියයට 43 ක සේවක සංඛ්‍යාවක් කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයෙහි වූ අතර, බියගම සහ කොග්ගල ආයෝජන ප්‍රවර්ධන කලාපයන්හි සේවකයින් මුළු සේවක සංඛ්‍යාවෙන් පිළිවෙලින් සියයට 16 ක් සහ සියයට 4 ක් විය.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ශ්‍රම බලකාය පිළිබඳ ත්‍රෛමාසිකව කරනු ලබන සමීක්ෂණයෙන් ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය පිළිබඳ වැදගත් තොරතුරු රැසක් හෙළිවේ. 1994 අප්‍රේල් මස අවසානය දක්වා වූ මාස 12 කාලය තුල පුද්ගලයින් 100,000 කට පමණ රැකියා ලැබී ඇතිබව පෙන්නුම් කරයි. නිෂ්පාදන අංශයෙහි 50,000 කට පමණ රැකියා අවස්ථා ඇති වී ඇති අතර සේවාවන්හි නියුක්ත සේවක අංශයෙහි ආසන්න වශයෙන් 210,000 කට පමණ රැකියා අවස්ථා ඇති වූ බව පෙන්නුම් කරයි. නිෂ්පාදන අංශයෙහි වැඩිම සේවා නියුක්ති අවස්ථාවන් උද වී ඇත්තේ ඇඟලුම් නිෂ්පාදන අනු අංශයෙහිය. කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය ක්‍රමයෙන් අඩුවීමක් පෙන්නුම් කරන අතර මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 41 ක් කෘෂිකාර්මික අංශයේ සේවයේ නිරතව සිටී.

1.45 සංඛ්‍යා සටහන

**ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය 1990 - 1994***

(පුද්ගලයින් දසලක්ෂ)

| ශීර්ෂය | 1990 | 1991 | 1992 | 1993 | 1994 |
|---|---|---|---|---|---|
| මුළු ශ්‍රම බලකාය | 6.00 | 5.83 | 5.80 | 6.08 | 6.17 |
| මුළු සේවා නියුක්තිය | 5.03 | 4.94 | 4.85 | 5.26 | 5.36 |
| **ආර්ථික අංශය** | | | | | |
| කෘෂිකාර්මික, ධීවර සත්ව පාලන සහ පතල් සහ කැනීම් කටයුතු | 2.49 | 2.23 | 2.01 | 2.45 | 2.23 |
| නිෂ්පාදන සහ උපයෝගීතා | 0.60 | 0.64 | 0.67 | 0.70 | 0.75 |
| ඉදිකිරීම් | 0.23 | 0.20 | 0.26 | 0.20 | 0.26 |
| සේවා | 1.71 | 1.87 | 1.91 | 1.91 | 2.12 |

* උතුර හා නැගෙනහිර පළාත් හැර

මූලය : ත්‍රෛමාසික ශ්‍රම බලකාය පිළිබඳ සමීක්ෂණය ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව.

විදේශීය රැකියා සඳහා පිටරටයෑම පසුගිය වර්ෂ කිහිපය තුලම වැඩිවීමක් පෙන්නුම් කළ අතර මෙම උපනතියම 1994 වර්ෂයේදී ද පෙන්නුම් කර ඇත. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් 1994 වර්ෂයේදී කරන ලද ගුවන් තොටුපල සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ලියාපදිංචි රැකියා ඒජන්සි ආයතන සහ වෙනත් මාර්ග වලින් 1994 වර්ෂයේදී රැකියා ලබාගත් මුළු සංඛ්‍යාව 131,863 කි. මෙය 1993 වසරට වඩා සියයට 2ක වැඩිවීමකි.

1994 වසර තුලදී කම්කරු සම්බන්ධතා සැලකිල්ලට ගත් කළ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සේවක ඉල්ලීම් පිළිබඳ නොසන්සුන්තා දක්නට ලැබිනි. අදල වර්ෂය තුලදී වැඩ වර්ජන 233 ක් පැවතුනි. අවුරුද්දේ අවසාන තුන් මස තුලදී වැඩවර්ජන 123ක් පැන නැඟුනු අතර 100 ක් කම්කරු හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ සහ අනිකුත් අදල අමාත්‍යාංශවල මැදිහත්වීමෙන් සමථයකට පත්කරන ලදී. 1994 දෙසැම්බර් මස අගවන විටදී වැඩ වර්ජන 23 ක් සමථයකට පත් නොවී පැවතුනි.